## සිංහ ජාත්‍යන්තරය

## දැක්ම Vision

ප්‍රජා හා මානුෂීය සේවාවෙහි ගෝලීය පුරෝගාමියා වීම.

## මෙහෙවර Mission

සෞඛ්‍යය සහ ශුභ සාධනය වැඩිදියුණු කිරීම, ප්‍රජාවන් සවිබල ගැන්වීම, ලෝක ව්‍යාප්ත ජීවිත වලට බලපාන පරිදි අවශ්‍යතා ඇති අයට මානුෂීය සේවාවන් සහ ආධාර මගින් සහය වීම, සහ සාමය සහ ජාත්‍යන්තර අවබෝධය දිරිගැන්වීම සඳහා සිංහ සමාජ, ස්වේච්ඡා සේවකයින් සහ හවුල්කරුවන් බලගැන්වීම.

## අරමුණු Purposes

සිංහ සමාජ ලෙස හැඳින්වෙන සේවා සමාජයන් සංවිධානය කිරීම, බලතල පැවරීම සහ අධීක්ෂණය කිරීම.

සිංහ සමාජයන්හි ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය සහ පරිපාලනය ප්‍රමිතිගත කිරීම.

ලෝක ප්‍රජාවන් අතර අවබෝධතාවයේ ජීවගුණය ඇතිකිරීම සහ පෝෂණය කිරීම.

යහපාලනයේ  සහ යහපත් පුරවැසිභාවයේ මූලධර්ම ප්‍රවර්ධනය කිරීම.

ප්‍රජාවෙහි පුරවැසි, සංස්කෘතික, සමාජීය සහ සදාචාරාත්මක සුභසාධනය පිළිබඳව සක්‍රිය උනන්දුවක් දැක්වීම.

සිංහ සමාජ මිත්‍රත්වයේ, යහපත් සහයෝගීතාවයේ සහ අන්‍යෝන්‍ය අවබෝධයේ බැඳීම් තුළින් එක්සත් කිරීම.

මහජන අභිලාෂයන්ට අදාල සියළු කරුණු පිළිබඳ විවෘත සාකච්ඡාවක් සඳහා මණ්ඩපයක් සැපයීම; කෙසේවෙතත්, පක්ෂ දේශපාලනය සහ නිකායගත ආගම් පිළිබඳව සාමාජිකයින් විවාද නොකළ යුතුය.

සේවාලැදි පුද්ගලයින්ට පෞද්ගලික මූල්‍ය ප්‍රතිලාභ වලින් තොරව ඔවුන්ගේ ප්‍රජාවට සේවය කිරීමටත්, වාණිජ, කර්මාන්ත, වෘත්තීය, පොදු කටයුතු සහ පෞද්ගලික ව්‍යාපාර වලදී කාර්යක්ෂමතාවය සහ ඉහල ආචාරධර්ම ප්‍රමිතීන් පවත්වා ගැනීමටත් උනන්දු කිරීම.

## ආචාර ධර්ම සංග්‍රහය Code of Ethics

මාගේ සේවාවේ අනර්ඝත්වය වෙනුවෙන් ලැබෙන කීර්තිය උදෙසා, අනලස් භාවිතය මගින් මාගේ වෘත්තියේ අගය පිළිබඳව තිබෙන මාගේ විශ්වාසය පෙන්වීම.

සාර්ථකත්වය අත්කර ගැනීමට හා මා හට සාධාරණ ලෙස ලැබියයුතු සියළු වේතන සහ ලාභ ලබාගැනීමට කටයුතු කරන නමුත්, යම් අනිසි වාසියක් ගැනීම හෝ නොමනා ක්‍රියාවක් නිසා මාගේ ආත්මාභිමානයට හානියක් වන කිසිඳු ලාභයක් හෝ සාර්ථකත්වයක් පිළිනොගැනීම.

මාගේ ව්‍යාපාරය ගොඩනැගීමේදී තවෙකෙකුගේ එකකට හානි කිරීම අවශ්‍ය නොවන බවත්, මාගේ සේවාලාභීන් හෝ පාරිභෝගිකයින් හට පක්ෂපාතී වීමටත්, මාහටම අවංක වීමටත් සිහි තබාගැනීම.

අන් අය කෙරෙහි මාගේ ස්ථාවරයේ හෝ ක්‍රියාවේ නිවැරදිබව හෝ සදාචාරත්මකබව පිළිබඳව සැකයක් ඇතිවන ඕනෑම විටෙක, එය මමත්වයෙන් තොරව නිරාකරණය කිරීම.

මිත්‍රත්වය උපක්‍රමයක් ලෙස නොව පරමාර්ථයක් ලෙස ග්‍රහණය කර ගැනීම. අව්‍යාජ මිත්‍රත්වය පවතින්නේ අන්‍යෝන්‍යව ඉටු කරන ලද  සේවාව මත නොවන බවද, අව්‍යාජ මිත්‍රත්වය, සේවාව ලබාදීමේ ආධ්‍යාත්මික ගුණය මත සේවාව භාරගන්නවා මිස, අන් කිසිවක් බලාපොරොත්තු නොවන බවද ධාරණය කර ගැනීම.

මාගේ ජාතියට, මාගේ රටට සහ මාගේ ප්‍රජාවට පුරවැසියෙකු ලෙස මාගේ බැඳීම් සැමවිටම සිහිතබාගැනීම, සහ ඔවුන්ට මාගේ නොසැලෙන පක්ෂපාතීභාවය වාචිකව, ක්‍රියාවෙන් සහ පැවැත්මෙන් ලබාදීම. ඔවුනට මාගේ කාලය, ශ්‍රමය හා ධනය නොමසුරුව ලබාදීම.

විපතට පත් වූවන්ට මාගේ අනුකම්පාවද, දුබලයින්ට මාගේ උපකාරයද, අවශ්‍යතා ඇති අයට මාගේ ධනයද ලබාදීම මගින් අන් අයට ආධාර කිරීම.

හානි කිරීමට නොව අභිවෘද්ධිය උදෙසා, මාගේ විවේචනයේදී ප්‍රවේශම් වීම සහ ඇගයීමේදී නොමසුරු වීම.

Translated by;

Lion Saman Liyanage MJF FDI

GST District Coordinator 2023/24, District 306 A2.